# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1488 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2023 திகதி

දිනය / Date – 18/12/2023 පැය 1425

## මාධ්‍ය නිවේදනය

### 01. මෙරට නිෂ්පාදිත ගිනි අවියකින් වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් - පොතුවිල් පොලිස් වසම.

2023.12.17 වන දින රාත්‍රි කාලයේ පොතුවිල් පොලිස් වසමේ ගල්අමුන ප්‍රදේශයේ දී ඉඩම් ආරවුලක් මත පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකුට මෙරට නිෂ්පාදිත ගිනි අවියකින් වෙඩි තබා ඇති බවට පොතුවිල් පොලිසියට 119 තොරතුරු මධ්‍යස්ථානයෙන් ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. වෙඩි වැදීමෙන් තුවාල ලැබූ පුද්ගලයා සියඹලාණ්ඩුව රෝහල වෙත ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වන පොතුවිල් පාර, හුලංනුගේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඝාතනයට සම්බන්ධ වයස අවුරුදු 53 ක් වන පොතුවිල් පාර, හුලංනුගේ ප්‍රදේශයේම පදිංචි සැකකරු වෙඩි තැබීම සඳහා යොදා ගන්නා ලද බවට ප්‍රකාශ කරන ලද මෙරට නිෂ්පාදිත ගිනි අවිය සමඟ පොලිස් ස්ථානයට ඉදිරිපත් වීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත.

මෘත ශරීරය සියඹලාණ්ඩුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මාරක රිය අනතුරක් - වාරියපොල පොලිස් වසම.

2023.12.18 වන අද දින අළුයම් කාලයේ වාරියපොල පොලිස් වසමේ රඹාවැව කඩහපොළ මාර්ගයේ රඹාවැව ප්‍රදේශයේදී කඩහපොල දෙස සිට රඹාවැව හන්දිය දෙසට ධාවනය කල ලොරි රථයක් මාර්ගය වම්පස නවතා තිබියදී එම දිසාවටම ධාවනය වූ යතුරු පැදියක් ලොරි රථයේ පිටුපස ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු සහ පසු පැදිකරු වාරියපොල රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇති අතර පසුපැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහල වෙත යොමු කර ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වන මැදවච්චිය කුඩා වැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**